# භික්ෂු පාරිශුද්ධියට හේතුවන උපෝෂථ විනය කර්මය

කුලියාපිටිය ශ්‍රී ශාසනාලංකාර මහා විහාරාධිපති මහාචාර්ය
**කබලෑවේ පියභාරති මහා ස්ථවිර**

දිනක් බුදුන්වහන්සේ සැවැත්නුවර පූර්වාරාමයෙහි දිනට යෙදුණු පොහොයෙහි සංඝයා පිරිවරා වැඩහුන්හ. මෙසේ වැඩසිටිය දී ප්‍රථමයාමය ඉක්ම ගිය විට ආනන්ද හිමි නැගිට සිවුර එකස්කොට පෙරව බුදුන්ට වැඳ මෙසේ අයැදියහ.

අභික්කන්තා භන්තෙ රත්ති නික්ඛන්තො පඨමො යාමො චිරනිසින්නො භික්ඛුසංඝො. උද්දිසතු භන්තෙ භගවා භික්ඛූනං පාතිමොක්ඛන්ති.

ස්වාමීනි! රාත්‍රිය එළැඹියාය. ප්‍රථම යාමය නික්ම ගියේය. භික්ෂු සංඝ තෙමේ බොහෝ වේලාවක් හුන්නේය. එනිසා ස්වාමීනි! භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට පාමොක් උදෙසන සේක්වායි කීහ. මෙසේ කී විට ද බුදුන්වහන්සේ නිශ්ශබ්ද වූ සේක.

මෙසේ මධ්‍යම රාත්‍රිය ඉක්ම ගිය විට ද අරුණු නැගි කල්හි ද ආනන්ද හිමි පාමොක් උදෙසන ලෙස බුදුන්ගෙන් අයැද සිටියහ. මෙතෙක් නිශ්ශබ්දව වැඩ සිටි බුදුන්වහන්සේ අවසන්හි මෙසේ වදාළහ.

"අපරිසුද්ධා ආනන්ද පරිසා"

ආනන්දය පිරිස පිරිසිදු නොවේ. මෙහිදී ඍද්ධිමතුන්ගෙන් උග්‍ර වූ මොග්ගල්ලාන මහ රහතන්වහන්සේ තම සිතින් භික්ෂූන්ගේ සිත් දැන ඒ අපිරිසිදු භික්ෂුව අතින් අල්වා දොරකොටුවෙන් පිටත්කොට දොර යතුරු දමා වෙත පැමිණ බුදුන්ට මෙසේ කීහ.

නික්ඛාමිතො සො භන්තෙ පුග්ගලො මයා. පරිසුද්ධා පරිසා. උද්දිසතු භන්තෙ භගවා භික්ඛූනං පාතිමොක්ඛන්ති.

ස්වාමීනි ඒ පුද්ගල තෙමේ මා විසින් බැහැර කරන ලදී. පිරිස පිරිසිදුය. ඒ නිසා භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට පාමොක් උදෙසන සේක්වා.

මෙහිදී බුදුන්වහන්සේ මහා සාගරයෙහි හා ශාසනයෙහි පවත්නා ආශ්චර්ය අද්භූත කරුණු ගෙන හැර දක්වා මෙසේ වදාළහ.

න දානාහං භික්ඛවෙ ඉතොපරං උපොසථං කරිස්සාමි. පාතිමොක්ඛං උද්දිසිස්සාමි. තුම්හෙවදානි භික්ඛවෙ ඉතොපරං උපොසථං කරෙය්‍යාථ පාතිමොක්ඛං උද්දිසෙය්‍යාථ.

මහණෙනි! මම දැන් මෙයින් මතු පොහොය නොකරන්නෙමි. පාමොක් නොඋදෙසන්නෙමි. මහණෙනි! නුඹලාම මෙයින් මතු පොහොය කරව්. පාමොක් උදෙසව්.

චූල්ලවග්ගපාළි පාතිමොක්ඛඨපනක්ඛන්ධකයෙහි සඳහන් මෙම ප්‍රවෘත්තිය අනුව මුලදී බුදුන්වහන්සේ චාතුද්දසි - පණ්ණරසි පොහොයවලදී භික්ෂූන්ට (ඔවා) පාමොක් දෙසූ බැව් හෙළි වේ. මෙයින් අනතුරුව පොහොයෙහි බුදුන් නැතිව භික්ෂූන්ටම පාමොක් දෙසීමට අනුදත්හ.

මහාවග්ගපාළි උපොසථක්ඛන්ධකයෙහි දැක්වෙන පරිදි මගධාධිපති බිම්බිසාර මහ රජුන්ගේ අයැදුමින් බුදුහු පොහොයෙහි රැස්වන ලෙස භික්ෂූන්ට අනුදත්හ. මෙහිදී බුදුන්ට මෙබඳු අදහසක් පහළ විය.

"යන්නූනාහං යානි මයා භික්ඛූනං පඤ්ඤත්තානි සික්ඛාපදානි තානි නෙසං පාතිමොක්ඛුද්දෙසං අනුජානෙය්‍යං, සො නෙසං භවිස්සති උපොසථකම්මන්ති."

මවිසින් භික්ෂූන්ට පණවන ලද ශික්ෂාපද ඔවුන්ට පාමොක් උදෙසීම්කොට අනුදනිම් නම් මැනැවි. එය ඔවුන්ට උපොසථ කර්මය වන්නේය.

මේ අනුව භික්ෂූන්ගේ සංවරය සඳහා බුදුන් වදාළ ශික්ෂාපද පක්ෂයකට වරක් පොහෝ දිනවල රැස්ව දේශනා කිරීම භික්ෂූන්ට උපොසථ කර්මය වන බැව් හෙළි වේ.

උප + වස + ථ > උපොසථ
මෙසේ නිපන් මේ "උපොසථ" ශබ්දය.

පාමොක් උදෙසීම
අෂ්ටාංග ශීලය
පොහෝ දිනය
පාරිශුද්ධිය අධිෂ්ඨානය
ප්‍රඥප්තිය
යන අර්ථයන්හි යෙදේ. එයින්

ආයාමාවුසො කප්පින උපොසථං ගමිස්සාමාති.
මෙහි උපොසථ ශබ්දය ප්‍රාතිමොක්ෂය උදෙසීමෙහි යෙදේ.

එවං අට්ඨංගසමන්නාගතො බො විසාඛෙ
උපොසථො උපවුත්ථො
මෙහි උපොසථො යනු අෂ්ටාංග ශීලයයි.

සුද්ධස්ස වෙ සදා ඵග්ගු
සුද්ධස්සුපොසථො සදා
මෙහි 'උපොසථො' යනුවෙන් උපවාසය කියැවේ.

උපොසථො නාම නාගරාජා
මෙහි උපොසථ ශබ්දය ප්‍රඥප්තියෙහි යෙදේ.

න භික්ඛවෙ තදහුපොසථෙ සභික්ඛකා ආවාසාති මෙහි උපවාස කළ යුතු දිනය කියැ වේ.

මෙසේ විවිධ අර්ථයන්හි යෙදෙන උපොසථ ශබ්දය මෙහිදී ප්‍රාතිමොක්‍ෂාගත ශික්‍ෂාපද දේශනා කිරීම් සංඛ්‍යාත පොහොය කිරීම් අර්ථයෙහි යෙදෙන බැව් දත යුතුය. ඒ මේ උපොසථ කර්මය.

චාතුද්දසී
පණ්ණරසී
සාමග්ගි

යැයි දින වශයෙන් ත්‍රිවිධ වේ. පැලවිය පටන් තිථි දින තුදුසෙකින් එළැඹෙනුයේ "චාතුද්දසී" නම් වේ. දින පසළොසෙකින් එළැඹෙනුයේ "පණ්ණරසී" නම් වේ. ඍතුවෙකැ තෙවන - සත්වන පොහොය චාතුද්දසී වන අතර, සෙසු පොහොය 'සුපණ්ණරසී' වේ. හෙදව සිටි සංඝයා යම් වර හෝ දිනෙක සමගි වී නම් එදින පොහොය කළ හැකිය. එය 'සාමග්ගි උපොසථ' නම් වේ.

තව ද සංඝ
ගණ
පුද්ගල

යැයි එය කාරකයන්ගේ වශයෙන් ද උපොසථය ත්‍රිවිධ වේ. එහි උපසම්පන්න භික්ෂූන් යටත් පිරිසෙයින් සිව් නමක් හෝ එයට වැඩි ගණනක් සීමාවෙක දී අත්පසට එළඹ සිදු කරන පොහොය **"සංඝ උපොසථ"** නම් වේ. එහිදී සුදුසු පරිදි ප්‍රාතිමොක්‍ෂය දේශනා කළ යුතුය. උපසම්පන්න භික්ෂූන් තෙනමක් සීමාවෙක අත්පසට එළඹ ඤත්තිය තබා සිදු කරනුයේ ගණ උපොසථයයි. දෙනමක් අතර ඔවුනොවුන්ගේ පාරිශුද්ධිය ප්‍රකාශ කිරීම් වශයෙන් සිදු කෙරෙනුයේ පුද්ගල උපොසථයයි. තව ද,

**සත්තුද්දෙස**
පාරිසුද්ධි
අධිට්ඨාන

යැයි කළ යුතු ආකාර වශයෙන් උපොසථ තුනෙකි. එහි ප්‍රාතිමොක්‍ෂාගත ශික්‍ෂාපද නිදානුද්දෙස - පාරාජිකුද්දෙස ආදී වශයෙන් දේශනා කිරීම සත්තුද්දෙස නම් වේ. "පරිසුද්ධො අහං භන්තෙ පරිසුද්ධොති මං ධාරෙථ" යනුවෙන් සවකීය පාරිශුද්ධිය ආරොචනය කොට ප්‍රතිඥා කිරීම් වශයෙන් සිදුකරනුයේ පාරිසුද්ධි උපොසථයයි. පොහොය කිරීමට අවශ්‍ය පූර්වකෘත්‍ය සියල්ල නිමවා වෙනත් උපසම්පන්න භික්ෂුවකගේ හෝ ඊට අපේක්‍ෂාවෙන් සිට දූත් මෙයින් මතු එබන්දෙකුගේ ඊට සිදු නොවෙතැයි සිතා අද මාගේ උපොසථය යැයි ඉටා ගැනීම "අධිට්ඨාන උපොසථ" නම් වේ.

පාමොක් උදෙසීමේ දී තමා අවත් ඇවතක් වේ නම් එය සංඝයාට හෝ ආසන්න භික්ෂුවකට හෝ ආරොචනය කළ යුතුය. එසේ නැතිනම් නිශ්ශබ්ද විය යුතුය. නිශ්ශබ්දතාවයෙන් සවකීය පාරිශුද්ධිය ප්‍රකාශ කෙළේ වේ. දැන දැන පැමිණි ඇවතක් ආරොචනය නොකිරීමෙන්, නිශ්ශබ්දව සිටීමෙන් සම්පජාන මුසාවාදය නිසා පචිති ඇවතක් සිදුවේ. මේ අනුව සියලු උපසම්පන්න භික්ෂූන් උපොසථ කර්මයෙන් සවකීය ශීලශුද්ධිය ඇති කරගත යුතුය.

"විනයො නාම සාසනස්ස ආයු."
විනය ශාසනයාගේ ආයුෂයයි.

---

(1) චුල්ලවග්ගපාළි - පාතිමොක්ඛ ඨපනක්ඛන්ධකය
(2) විනය කොෂය 321 පිටුව
(3) සුමංගල විලාසිනි නෙ. මු. 98 පිටුව
සාමඤ්ඤඵලසුත්තවණ්ණනා